**<u>මුධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය (SL 1 -2006) යටතේ වන සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සංශෝධන අංක - 01</u>**

| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 12. (අන්තර්ග්‍රහණ ක්‍රමවේදය) | (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ)<br><br>මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සමුපකාර සංවර්ධන සහකාර (උප) කොමසාරිස්වරුන්, සේවා කාලය පදනම් කර ගනිමින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ III/II ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ. | 12. ස්ථිර කිරීමේ කොන්දේසි | සේවයේ III වන ශ්‍රේණියට කුසලතා මත බඳවා ගනු ලබන නිලධරයෙක් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වන්නේය. එම පරිවාස කාල පරිච්ඡේදයේ නොහොත් වැඩ බැලීමේ කාල පරිච්ඡේදය අවසානයේදී නිලධාරියාගේ වැඩ හා හැසිරීම සතුටුදායකව පැවති බව නිශ්චය කරනු ලැබුවහොත් ද එම තනතුරේ ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් සියලුම අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් ද පත්වීම් බලධරයා සෑහීමකට පත්වන්නේ නම් ද නිලධරයන්ගේ පත්වීම ස්ථිර කරනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CP/Gen/ හා 2020.07.02 දිනැති ලිපිය අනුව පහළ වැටුප් කාණ්ඩයක සේවය කරන නිලධාරියෙකු SL-1 වැටුප් ඛණ්ඩය සඳහා බඳවා ගැනීම ශ්‍රේණි උසස් වීමක් නොවන බවත්, SL-1 වැටුප් ඛණ්ඩයේ තනතුරකට බඳවා ගැනීමෙන් පසු එක් අවුරුදු බඳවා ගැනීමේ කාල සීමාවකට පසුව තනතුරෙහි ස්ථිර කළ යුතු බවද එම ලිපිය මගින් දැනුම් දී ඇති බැවින්, සේවය ස්ථිර කිරීමට අදාළ විධිවිධාන ඇතුලත් කිරීම. |
| 12.1 | නැත. | 12.1 (අන්තර්ග්‍රහණ ක්‍රමවේදය) | (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ).<br><br>මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සමුපකාර සංවර්ධන සහකාර (උප) කොමසාරිස්වරුන්, සේවා කාලය පදනම් කර ගනිමින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ III/II ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ. | ඡේද අංක 12 යටතේ ස්ථිර කිරීමේ කොන්දේසි පරිපාටි සංශෝධනයට ඇතුළත් කිරීම නිසා ඡේද අංක 12 යටතේ වූ අන්තර්ග්‍රහණ ක්‍රමවේදය 12.1 ලෙස සංශෝධනය කොට ඇත.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 05 - 31 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් |

මධ්‍යම පළාත් සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු.

| | | | |
|---|---|---|---|
| 01. | පී.ජී. අමරකෝන් මහතා | (සභාපති) | ............ |
| 02. | ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ............ |
| 03. | ජේ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ............ |
| 04. | ජේ.එම්. වයිස් මහතා | (සාමාජික) | ............ |
| 05. | එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා | (සාමාජික) | ............ |
| 06. | ජේ.ඩී.කේ. වික්‍රමරත්න මහතා | (සාමාජික) | ............ |
| 07. | පී.ටී.ජී. ගුණතිලක මයා | (සාමාජික) | ............ |

දිනය 2022.04.27

ආණ්ඩුකාර ලේකම්,

2022.04.27 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2022/488 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය (SL 1 – 2006) යටතේ වන සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2022.05.9

..........................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත

ඩබ්ලිව්. දයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත

2022-05-31